**රජ්ගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**--------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 17 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට රජ්ගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර තැන්පත් ගිණුම් 05 කට අදාළ පොලී ගණනය කර නොදැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.13,443,513 ක දායක මුදල ගිණුම්ගත කර නොතිබීමෙන් වියදම හා ගෙවිය යුතු ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) එකිනෙක සමාන වියයුතු ස්ථාවර වත්කම් ශේෂය සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය අතර රු.3,401,225 ක වෙනසක් දක්නට ලැබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුමේ ආදායම් ආධාර රු.342,276 ක් හා මූලධන ආධාර රු.50,397 ක් අඩුවෙන් ද, සැපයුම් හා උපකරණ වියදම රු.23,496 ක් වැඩියෙන් දක්වා තිබීමෙන් ලාභය රු.416,169 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.41,318 ක් වැඩියෙන් දැක්වීම නිසා එම ප්‍රමාණයෙන් ජංගම බැරකම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු ආයෝජන වටිනාකම රු.1,098,555 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ජල කර්මාන්ත තොගයේ වටිනාකම රු.234,633 ක් ලෙස දක්වා තිබුණ ද, එවැනි තොගයක් ලේඛනගතව හෝ භෞතිකව නොතිබීමෙන් ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළදී ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලද රු.342,276 ක් වූ තොග පරිත්‍යාග, ආයුර්වේද තොග ගිණුමට හර කර නොතිබීම නිසා එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.76,603,320 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.62,988,304 ක් විය.

(ආ) ගිණුම් විෂයයන් 04 කට අදාළව පොදු ලෙජරයේ දැක්වෙන ලෙජර් ගිණුම් ශේෂ සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ අතර රු.783,704 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම

සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.288,833 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කර නොතිබුණි.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දිගුකාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.10,053,912 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම හඳුනාගෙන ගිණුම් නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ රු.1,873,405 ක හිඟහිටි කර්මාන්ත ණයගැති ශේෂ 04 ක් ඇතුළත්ව තිබුණි.

(ඇ) 2001 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.571,597 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම නිරවුල් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.629,665 ක් වූ පොදු ණයහිමි ශේෂය හා වෙනත් ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේ දීත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට වසර 03 කටත් පැරණි රු.2,462,916 ක් වූ කර්මාන්ත 10 කට අදාළ ණයහිමි ශේෂ නිරවුල් කිරීම් සමාලෝචිත වර්ෂයේදීත් කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.42,898,310 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන ද, එකතුව රු.6,808,936 ක් වූ තොග සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල වාර්තා, ලේඛන හා උපලේඛන ද, රු.11,224,945 ක් වූ ණයගැතියෝ සම්බන්ධයෙන් ණයගැති ලේඛන ද, රු.13,711,478 ක් වූ ණයහිමියන් සම්බන්ධයෙන් ණයහිමි ලේඛනය ද, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ ද, රු.7,483,404 ක් වූ විවිධ තැන්පත් සම්බන්ධයෙන් උපලේඛනය සහ තැන්පතු ලේඛන ද, රු.525,390 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද අත්තිකාරම් ලේඛනය ද, රු.1,987,033 ක් වූ ස්ථාවර තැන්පත් සම්බන්ධයෙන් තැන්පතු සහතික ද, රු.516,670 ක් වූ නිලධාරීන් වෙත ඇති මුදල් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන ද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 395(ඇ) | එක් එක් මාසයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශය ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර පිළියෙල කළයුතු වුවත්, පොදු ගිණුම සඳහා 2016 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනය 2017 අගෝස්තු 30 දින දක්වාම පිළියෙල කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 570 | වර්ෂ 03 කට අධික කාලයක සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.196,439 ක් වූ තැන්පතු වර්ග 05 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.22,308,224 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.13,893,961 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.36,202,185 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉකුත් වර්ෂවල තත්ත්වය සමඟ සමාලෝචිත වර්ෂයේ තත්ත්වය සැසඳීමේ දී ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය සතුටුදායක මට්ටමක නොපවතින බව පෙන්නුම් කෙරුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය අවසානයට අයකරගත යුතු වූ රු.11,331,510 ක් වූ වරිපනම් බදුවලින් වර්ෂය තුළ අයකිරීම රු. 770,202 ක් හෙවත් සියයට 07 ක් පමණ විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 2.3.2 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවැති රු.676,534 ක හිඟයෙන් සහ රු.105,600 ක වර්ෂයේ බිල් කිරීම් වලින් සියයට 14 ක් පමණක් වර්ෂය තුළ අය කරගෙන තිබුණු අතර, රු.674,044 ක් වූ හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.3 ව්‍යාපාර බදු

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.200,880 ක ව්‍යාපාර බදු හිඟයෙන් සහ රු.90,460 ක වර්ෂයේ බිල් කිරීම්වලින් සියයට 38 ක් පමණක් වර්ෂය තුළ අය කරගෙන තිබුණු අතර, හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.7,178,722 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.31,560,641 ක් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 පවරා නොගත් වත්කම්
---------------------------

සභාව විසින් පරිහරණය කරන වාහන 11 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස සභාව විසින් ආදේශක පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 06 දෙනෙකු සඳහා 2016 වර්ෂය තුළ දී වැටුප් හා දීමනා වශයෙන් රු.1,317,744 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) සභාවේ කම්කරුවන් ලෙස බඳවාගත් සේවකයින් 11 දෙනෙකුට කළමනාකරණ සහකාර තනතුරුවල රාජකාරී පවරා තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් කඩ කාමර 22 සම්බන්ධව ඇති කරගත් ගිවිසුම් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛය අනුව පිළියෙල කර නොතිබූ අතර, සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. තවද, කඩ කාමර 03 ක ගිවිසුම්වල කාලසීමාවන් සඳහන් කර නොතිබුණි.

(ආ) ඉඩම් කැබලි කර විකිණීම සඳහා පුද්ගලික සමාගමක් විසින් අනුමත කරවාගෙන තිබූ හෙක්ටයාර 0.7740 ක විශාල ඉඩම විකිණීමෙන් සභාව විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව එම ඉඩම විකිණීමෙන් ලත් ආදායමින් සියයට 1 කට සමාන බදු අය කරගෙන නොතිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

සභාව විසින් 2016 වර්ෂය තුළ ඉටු කරන ලද කර්මාන්ත සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රජගම අං හන්දිය "සරණ" අවමංගල්‍යාධාර සමිති ගොඩනැගිල්ලේ කොටසක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා දකුණු පළාත් සංවර්ධන සැලැස්මේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු.100,000 ක මුදලක් අනුමත වී තිබුණු අතර, ගොඩනැගිල්ල අත්තිවාරමට වඩා අහල්

දෙකක් පමණ පිටතට බිත්ති බැඳ තිබූ බැවින් අත්තිවාරම සහ බිත්ති අතර හිඩැසක් නිර්මාණය වී තිබුණි. ඒ අනුව ගොඩනැගිල්ලේ ශක්තිමත් භාවය පිළිබඳ විගණනයට ගැටළුසහගත විය.

(ආ) මලවැන්න මකලාණ්ඩුව මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.446,030 ක මුදලක් ගෙවා තිබුණු නමුත්, ව්‍යාපෘතිය නිමකර වර්ෂයක් ගත වීමටත් පෙර මාර්ගය පුරාවට ගල් මතු වී, ගල් ගැලවීමකට ලක්ව තිබූ අතර, ස්ථාන දෙකක වර්ග අඩි 06 ක් පමණ මාර්ගය කැඩී ගොස් තිබුණි.

## 3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

----------------------

පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති 13 ක් සහ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති 14 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.6 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර 03 කට අධික කාලයක සිට නිශ්ක්‍රීයව පැවති වාහන 06 ක් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන පරිදි අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර, සභාවට අයත් ඉඩමක දිරාපත් වෙමින් පැවතුණි.

(ආ) 2012 වර්ෂයටත් පෙර මිලදී ගත් වායුසමන යන්ත්‍ර දෙකක් වසර දෙකකට අධික කාලයක සිට අක්‍රියව පැවති අතර, ඒවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා අරමුදලින් රු.103,200 ක මුදලක් වැයකර, 2014 වර්ෂයේ දී සවිකර තිබූ ආරක්ෂිත කැමරා පද්ධතිය වසර 02 කටත් අධික කාලයක සිට අක්‍රීයව පැවතුණි.

## 3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව පහත කරුණු අනාවරණය විය.

(අ) සභාව විසින් මධ්‍යම පරිසර අධිකාරියේ හා පිලිසරු ව්‍යාපෘතියේ ආධාර ඇතිව මොන්රෝවියාවත්ත ඉඩමේ ඝණ අපද්‍රව්‍ය ව්‍යාපෘතියක් ආරම්භ කිරීම නිසා සභාවේ කොම්පෝස්ට් නිෂ්පාදනය වසර 03 කට අධික කාලයක සිට නතර කර තිබූ බැවින් ඒ සඳහා භාවිතා කළ රු.599,000 ක් වටිනා යන්ත්‍රෝපකරණ නිෂ්ක්‍රීයව සභාවට අයත් වාහන අංගනයේ තබා තිබුණි.

(ආ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභා බලප්‍රදේශයේ බෙදාහැරීමට ලබාදුන් කසළ බඳුන් 35 ක් වසරකට ආසන්න කාලයක් සභාවට අයත් වාහන අංගනයේ තබා තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 06 ක එකතුව රු.20,818,575 ක් වූ ඉතිරිවීම් ද, තවත් විෂයයන් 02 ක රු.236,341 ක් වූ අහිතකර විචලනයන් ද, ආදායම් විෂයයන් 06 ක එකතුව රු.23,143,034 ක් වූ ළඟාකර නොගත් ඉලක්ක ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01 /නා.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.4 නොවිසඳී ඇති විගණන ඡේද**

--------------------------------

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ 2.2.2 ඡේදයේ (ආ) සිට (ඌ) දක්වා වූ ඡේදවලින් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීමට එකඟ වී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අවශ්‍ය නිවැරදි කිරීම් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් පන්ති අනුව වෙන් වෙන්ව විස්තර දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) | වාහන පාලනය | (i) | වාහනවලට අදාළ විස්තර ඇතුළත් කර ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| | | (iii) | ඇතැම් වාහන කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොගැනීම නිසා දිරාපත් වෙමින් පැවතුණි. |
| | | (iv) | සභාව විසින් භාවිතයට යොදවා ගන්නා වාහනවල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ආදායම් පාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක නොකිරීම නිසා හිඟ ආදායම් ශේෂ සෑම වර්ෂයකම ඉහළ අගයක් ගෙන තිබුණි. |
| | | (ii) | මුද්දර ගාස්තු ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | ඉකුත් වර්ෂවල සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින ගිණුම් ශේෂ පිළිබඳව සොයා බලා අවශ්‍ය ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශනවල සහ ඊට අදාළ උපලේඛන වල දැක්වෙන ශේෂ අතර, පවතින වෙනස්කම් හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිවැරදි කර නොතිබුණි. |
| | | (iii) | දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වාරික ගෙවීම පිළිබඳ විස්තර ඇතුළත් කර, ණය ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | | (iv) | සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.<br>• හානි පිළිබඳ ලේඛනය<br>• ණයහිමි ලේඛනය<br>• ණයගැති ලේඛනය<br>• පරිත්‍යාග ලේඛනය<br>• පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය |

| | | | |
|---|---|---|---|
| | | (v) | අවිනිශ්චිත ගිණුමේ ශේෂය පිළිබඳ පරීක්ෂා කර බලා, අදාළ ගැලපීම් කර, ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | සභාව සඳහා අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා තිබුණු 25 ක අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | ද්විතීයික සේවා ගණයේ නිලධාරියකු විසින් ඉටු කළයුතු කාර්යයන් කම්කරු සේවිකාවකට පවරා තිබුණි. |
| (ඊ) | අයවැය පාලනය | (i) | වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන් කරවාගෙන ඇති වියදම් විෂයයක සම්පූර්ණ ප්‍රතිපාදනය ද, තවත් වියදම් විෂයයන් 06 ක සැලකිය යුතු ඉතිරි කිරීම් ද පැවතුණි. |
| | | (ii) | අනුමත සීමාවන් ඉක්මවා වියදම් විෂයයන් දෙකක ඉහළ අගයක වියදම් දරා තිබුණි. |
| | | (iii) | ආදායම් විෂයයන් 06 ක අයවැය ලේඛනයේ දක්වා තිබූ ආදායම් ඉලක්ක ළඟා කරගෙන නොතිබුණි. |
| | | (iv) | වියදම් සහ ආදායම් පිළිබඳව පසු විපරම් කර, අයවැය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |